සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

## ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දෙවියන් වහන්සේ මනුෂ්‍යයා නිර්මාණය කළේ,
    1. පොළවෙන් ගත් දූවිල්ලෙන් ය.
    2. මැටිවලින් ය.
    3. මැටි හා හිමවලින් ය.
    4. හිමවලින් ය.

02. දෙවියන් වහන්සේ මිනිසාට ලබා දුන් වගකීමක් වන්නේ,
    1. ගස් කපා විනාශ කිරීම ය.
    2. දරු සම්පත් ලබා වර්ධනය වීම ය.
    3. වනාන්තර එළිපෙහෙළි කිරීම ය.
    4. සතුන් විනාශ කිරීම ය.

03. දෙවිඳුන්ගේ තිර පෙමින් ලැබෙන වරප්‍රසාදයක් වන්නේ,
    1. අසමඟියෙන් පිරි ජීවිතයක්ය.
    2. රෝග පීඩාවන් ය.
    3. වෛරයෙන් පිරුනු ජීවිතයක්ය.
    4. නිරෝගී ජීවිතයක්ය.

04. අප අන් අයට පරිත්‍යාග කල යුතු ප්‍රේමයේ දීමනාවක් වන්නේ,
    1. අන් අය ප්‍රතික්ෂේප කිරීම ය.
    2. යහළුවන් වැරදිවලට පෙළඹීම ය.
    3. අයහපත කිරීමට මඟ පෙන්වීම ය.
    4. වැරදි කරන අයට සමාව දීම ය.

05. ස්නාවක ජොහාන්තුමා ආහාරයට ගත්තේ,
    1. රොටී සහ පාන් ය.
    2. රොටී සහ මාළු ය.
    3. පළගැටියන් සහ රොටී ය.
    4. පළගැටියන් සහ වන මීය.

- අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.

06. "ඔබ පොළවේ ලුණුය. ( )
07. ජේසුස් වහන්සේ පාළුකරයේ ගත කල දින හතරකි. ( )
08. නිහතමානිකම ජොහාන්තුමා සතු ගුණාංගයක් නොවේ. ( )
09. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා ගණන තුනකි. ( )
10. පරිසරය අප ආරක්ෂා කළ යුතුය. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට A කොටසේ දැක්වෙන වගන්තිය හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 11. ආදම් සහ ඒව සිටි උයන | නිරෝගිකම |
| 12. දෙවිඳුන්ගේ තිරසර පෙම තුළින් අපට ලැබේ | ආලෝකය |
| 13. ජොහාන්තුමාගේ පියා | පෙන්තකොස්ත දින |
| 14. ඔබ ලෝකයේ | සෙකරියස් |
| 15. ශුද්ධාත්ම ආගමනය සිදුවූයේ | ඒදන් |

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(පුත්‍රයා, තෝමස්තුමාය, පහකළ, 3000, යාච්ඤාව)

16. පේදුරුතුමාගේ දේශනයෙන් ...................................................................... සෙනඟ හැරීම ලැබූහ.
17. මුල් කිතුණු සභාවේ පදනම වූයේ ..................................................................ය.
18. ''මාගේ ස්වාමිනි මාගේ දෙවියනි'' යනුවෙන් ප්‍රකාශකල ගෝලයා වන්නේ ......................................ය.
19. ''ස්ත්‍රිය මෙන්න ඔබේ ..............................................''
20. ''පියාණෙනි හැකි නම් මේ කුසලාන මා කෙරෙන් ................................................ මැනව.

---

II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු ලියන්න.
    - i. දේව ගරු බිය ජීවිතයක් ගත කිරීමට කළ යුතු දේවල් 02 ක් ලියන්න.
    - ii. පවුලක් ලෙස එකට ජීවත් වීමෙන් ලැබෙන වටිනාකම් 02 ක් ලියන්න.
    - iii. ජොහාන්තුමා ''පොළොං වංශය'' කියා ආමන්ත්‍රණය කලේ කාටද?
    - iv. ජේසුස් වහන්සේට පැමිණි පළමු පරීක්ෂාවේදී යක්ෂයාට ලබාදුන් පිළිතුර ලියන්න.
    - v. ජේසුස් වහන්සේ ඉගැන්වීම් සඳහා තෝරාගත් ස්ථාන 02ක් ලියන්න.
    - vi. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ඇසීමට නිතර උන්වහන්සේ වෙත පැමිණි අය කවුද?
    - vii. සුදර්ශන දොරටුව අසල සිටි කොරවූ මිනිසා සුවකලේ කවුද?
    - viii. සමාජය තුළ දරුවන්ට ඇති පීඩා 02 ක් ලියන්න.

02. 1. රන් අණ ලියා දක්වන්න.
    2. අන් අය ඔබට කෙසේ සලකනවාට ඔබ කැමතිද? කරුණු 3 ක් ලියන්න.
    3. යහළුවන් වෙනුවෙන් ඔබට කල හැකි යහපත් ක්‍රියා 05 ක් ලියන්න.

03. ''වලාකුළුවලින් වැස්ස මවා සව් සත වෙත එය එවන්නේ එතුමාණෝය.''
    1. ඉහත ප්‍රකාශය අඩංගු ශුද්ධවූ බයිබලයේ ග්‍රන්ථය කුමක්ද?
    2. චක්‍රාකාර දේව නිමවුම් 03 ක් ලියන්න.
    3. මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කල හැකි දේවල් 05 ක් ලියන්න.

04. 1. ජොහාන්තුමා දේශනා කලේ කුමක් ගැනද?
    2. ස්නාවක ජොහාන්තුමාගේ නිහතමානිත්වය කැපී පෙනුන අවස්ථාවක් ලියන්න.
    3. ජොහාන්තුමාගේ ජීවිතයෙන් ඔබට ඉගෙනගත හැකි ආදර්ශ 05 ක් ලියන්න.

05. 1. ඔබේ සතුරන් වෙනුවෙන් ඔබට කුමක් කරන්නැයි ජේසුස් වහන්සේ පවසන්නේද?
    2. ඔබට පීඩා කරන්නන් උදෙසා කළ හැකි ක්‍රියා 03 ක් ලියන්න.
    3. කිතුණු දරුවෙකු ලෙස පන්ති කාමරයේ අන් අය සමඟ කටයුතු කරන ආකාරයන් 5 ක් ලියන්න.

06. 1. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා ගණන කීයද?
    2. ජේසුස් වහන්සේ පරීක්ෂා ජය ගත්තේ කෙසේද? කරුණු 2 ක් ලියන්න.
    3. ඔබට පරීක්ෂා ජය ගැනීමට කළ හැකි දේවල් 05 ක් ලියන්න.